


**මෙම සමාගමේ කටුනායක, රත්මලාන සහ මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොලවල පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා මෙහි දක්වා ඇති සුදුසුකම් හා සේවා පළපුරුද්ද සපුරා ඇත පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## වෛද්‍ය උපස්ථායක 1 වන ශ්‍රේණිය තනතුර (කොන්ත්‍රාත් පදනම)
## වෛද්‍ය උපස්ථායිකා 1 වන ශ්‍රේණිය තනතුර (කොන්ත්‍රාත් පදනම)

1. **රැකියාවේ ස්වභාවය** : ගුවන් තොටුපොල වෛද්‍ය මධ්‍යස්ථානයේ සේවා අරමුණ ඉටු කිරීමට අදාල වෛද්‍ය හා වෛද්‍ය නොවන කාර්යය මණ්ඩලයට සහාය වීම, වෛද්‍ය මධ්‍යස්ථානයට ප්‍රතිකාර සඳහා පැමිණෙන මගීන්ට හා ගුවන් තොටුපොල කාර්යය මණ්ඩලයට උපස්ථාන කිරීම හා කාර්යාල කටයුතු සඳහා සහාය වීම.

2. **රැකියාවේ වගකීම්** :
   - ➢ වෛද්‍ය මධ්‍යස්ථානයේ දෛනික රාජකාරි කටයුතු සඳහා හෙද නිලධාරිනියන්ට සහාය දැක්වීම.
   - ➢ වෛද්‍ය හා ශෛල්‍ය වෛද්‍ය උපකරණ පිරිසිදු කිරීම සහ ජීවානුහරණය කිරීම.
   - ➢ සැරහුම් සැකසීම හා ජීවානුහරණය කිරීම.
   - ➢ අසාධ්‍ය රෝගී මගීන් හා ආයතනයේ රෝගී සේවක සේවිකාවන් ගිලන්රථයෙන් රෝහල් වෙත රැගෙන යාම.
   - ➢ වෛද්‍ය මධ්‍යස්ථානය සැමවිටම පිරිසිදුව තබා ගැනීමට වග බලා ගැනීම.
   - ➢ ඇඳ ඇතිරිලි මාරු කිරීම, සැකසීම හා ලොන්ඩ්‍රිය වෙත යැවීම.
   - ➢ වෛද්‍ය මධ්‍යස්ථානයේ ඉන්වෙන්ට්‍රිය පරීක්ෂා කිරීම සඳහා හෙද නිලධාරිනියට සහාය දැක්වීම.
   - ➢ වෛද්‍ය මධ්‍යස්ථානයේ වෛද්‍ය හා වෛද්‍ය නොවන සියලුම අවශ්‍යතා සඳහා, රාජකාරි වෛද්‍යතුමන්, හෙද නිලධාරිනීන්ගේ කාර්යාලීය කටයුතු හා ආයතනයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරීතුමාගේ රාජකාරි කටයුතු සඳහා සහාය දැක්වීම.

3. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්** :
   1. ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව හෝ සෞඛ්‍යය යන විෂයයන් ඇතුලත්ව අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් විෂයයන් 6 ක් අවම වශයෙන් සමත්විය යුතුය.
   2. ප්‍රථමාධාර සහතිකයක් (CPR) ලබා තිබිය යුතුය.

4. **සේවා පළපුරුද්ද** : අදාල ක්ෂේත්‍රයෙන් අවම වශයෙන් **වසර හතර (04)**ක සේවා පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

5. **වයස** : අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට වයස අවුරුදු 35ට අඩුවිය යුතුයි.

6. **තෝරා ගැනීමේ ක්‍රමය** : ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**පොදු කරුණු**

**වැටුප - තෝරා ගනු ලබන්නන් හට ආකර්ශනීය මාසික දීමනාවක් හිමිවේ.**

ඉහත තනතුරු සඳහා තෝරා ගත ලබන අයදුම්කරුවන් දිවයිනේ පිහිටි ඕනෑම ගුවන් තොටුපොලක අවශ්‍යතාවය අනුව සේවය කල යුතුවේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව සකස් කළ අයදුම්පතක් පහත සඳහන් ලිපිනයට 2021 **අගෝස්තු මස** 14 වන දිනට පෙර ලැබෙන සේ **ලියාපදිංචි තැපෑලෙන් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුවේ.

**අධ්‍යාපන, පාඨමාලා, සේවා සහ අදාල අනෙකුත් සහතික වල ඡායා පිටපත් සමඟ ඉදිරිපත් නොකරන අයදුම්පත් සහ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

---

**සභාපති**
**එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) (ප්‍රයිවට්) ලිමිටඩ්**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**
**කටුනායක**

දිනය - 03/08/2021